## නැගෙනහිර පලාතේ දුගී දුප්පත්කම දුරලීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

1. **මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගත වන ගැලපීම් වලින් ඇතිවන බලපෑම් හැරුනු විට මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2010 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) ප්‍රතිපාදනය කරන ලද අරමුදල් ඒවා ප්‍රතිපාදනය කරනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුලදී විශේෂ (යෙන්) ගිණුමෙන් ආපසු ගැනීම් සහ එම ගිණුමට ඌන පූරණය කිරීම්, ව්‍යාපෘතිය මගින් පවත්වා ගෙන යනු ලැබූ පොත්පත් සහ වාර්තා වල සත්‍ය හා සාධාරණ ලෙස හෙලිදරව් කර තිබුණු බව හා 2010 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමේ නියමකර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම්පත් ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශය(වි.ප.) කෙරෙහි සනාථ කිරීම සඳහා සාධාරණ ලෙස විශ්වාස තැබිය හැකි බව.

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන් වලට අනුකූලව කටයුතු කර තිබුණු බවත්ය.

2. **මූල්‍ය ප්‍රකාශන**

2.1 **මූල්‍ය කාර්යසාධනය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ ලබාගත හැකිවූ තොරතුරු වලට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ වියදම රු. 2,573,697,860 ක් වූ අතර 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු. 5,380,039,837 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම හා ඉකුත් වර්ෂය සඳහා වියදම් සහ 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත සඳහන් ප්‍රකාශයෙන් දැක්වේ.

| වියදම් වර්ගය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2010 | 2009 | |
| | රු. | රු. | රු. |
| ස්ථාවර වත්කම් | 57,915 | 105,300 | 104,673 |
| කෙර්ගෙන යන වැඩ | 2,394,840,957 | 1,622,754,746 | 4,876,231,213 |
| උපදේශක සේවා | 178,798,988 | 176,688,736 | 503,703,951 |
| | 2,573,697,860 | 1,799,548,782 | 5,380,039,837 |

## 2.2 විශේෂ (යෙන්) ගිණුම

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ ලබාගත හැකිවූ තොරතුරු වලට අනුව සමාලෝචිත වර්ෂයේ විශේෂ (යෙන්) ගිණුමේ මෙහෙයුම් සහ 2010 දෙසැම්බර් 31 දිනට ශේෂය පහත දැක්වේ.

| විස්තර | ශ්‍රී.ලං.රු. (මි) | ශ්‍රී.ලං.රු. (මි) | යෙන් (මි) |
|---|---|---|---|
| 2010 ජනවාරි 01 දිනට ශේෂය | | 2,928.9 | 2,410.2 |
| අඩුකළා :- ආපසු ගැනීම් | 1,585.4 | | 1,219.9 |
| විදේශ විනිමය ලාභය | (255.8) | 1,329.6 | - |
| 2010 දෙසැම්බර් 31 දිනට ශේෂය | | 1,599.3 | 1,190.3 |

## 3. විගණන නිරීක්ෂණ

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

### 3.1 ගිණුම්කරණ අඩුපාඩු

(i) සමාලෝචිත වර්ෂය තුලදී විදේශ ආධාර ගිණුමෙන් සිදු කරන ලද ගනුදෙනුවලට අදාලව විදේශ විනිමය හුවමාරු වාසි/අවාසි ගණනය කර නොතිබුණු අතර ගිණුම්වල හෙළිදරව් කර නොතිබුණි. .

(ii) ව්‍යාපෘතිය 2006 වර්ෂයේදී ආරම්භ කර තිබුණද 2005 වර්ෂයට අදාල මාර්ග සංවර්ධන අධිකාරියේ පොදු කාර්ය වියදම් ලෙස රු.1,321,098 ක් 2008 වර්ෂය තුලදී මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ව්‍යාපෘති අරමුදල් වලින් ප්‍රතිපූර්ණය කර තිබුණ අතර මෙම ගනුදෙනුව 2010 වර්ෂයේදී ද නිරවුල් කර නොතිබුණි.

(iii) 2010 වර්ෂය තුලදී එකතුව රු.17,756,097 ක මුදලක් ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයෙන් ජලනල ඇතිරීමේදී ව්‍යාපෘතිය විසින් සංවර්ධනය කරනු ලැබූ මාර්ගයන්හ කැනීම් හා පලුදුවීම් හේතුවෙන් වන අලුත්වැඩියාවන් සඳහා ලැබී තිබුණි. මෙම මුදලින් රු.2,937,763 ක මුදලක් එනම් 16.55% ක ප්‍රමාණයක් පමණක් අදාල කාර්යය සඳහා උපයෝජනය කර තිබුණි. ඉතිරි රු.14,818,334 ක මුදල එනම් 83.45% ක් ව්‍යාපෘති කාර්යයන් සඳහා උපයෝජනය නොකර වෙනත් අගම ගිණුමකට මාරු කර තිබුණි.

(iv) කොන්ත්‍රාත්කරු සහ උපදේශකට ගෙවිය යුතු එකතුව රු.200,145,615 ක් 2009 වර්ෂයෙදී ලැබිය යුතු විදේශාධාර ගිණුමට ගැලපීම් කර තිබුණද 2010 වර්ෂය සඳහා ද නැවත එම මුදල ගිණුම්වල ගැලපීම් කර තිබුණි. මේ නිසා විදේශාධාර ගිණුම සහ කොන්ත්‍රාත්කරුට හා උපදේශකට ගෙවිය යුතු මුදල රු.200,145,615 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(v) 2010 දෙසැම්බර් මාසයේදී කොන්ත්‍රාත්කරු වෙත යෙන් 24,533,397ක් ගෙවා තිබුණ ද ව්‍යාපෘතිය විසින් වැරදි ලෙස එම වටිනාකම ගිණුම්ගත කර තිබුණෙන් ලැබියයුතු විදේශාධාර ගිණුමේ සහ කොන්ත්‍රාත්කරුවන්ගේ ගිණුමේ යෙන් 24,533,397 ක වැඩියෙන් දැක්වීමක් නිරීක්ෂණය විය.

(vi) සැපයුම්කරුවකුට ගෙවනු ලැබූ මුදලක් ගැලපීම හේතුකොටගෙන සමාලෝචිත වර්ෂය සඳහා උපචිත වියදම් සඳහා වූ වෙන්කිරීම රු.280,000 කන් වැඩියෙන් දක්වා තිබුණි.

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

### 3.2.1 කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම්

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ

(අ) **මාර්ග ප්‍රතිසංස්කරණය**

(iii) කොන්ත්‍රාත් ගිවිසුමට අනුව 2010 දෙසැම්බර් 31 දින වන විට මාර්ග කොටසේ සිවිල් වැඩ අවසන් කළයුතු වවද මිළ ප්‍රමාණ පත්‍රය අනුව අයිතම් 139 කට අදාලව රු.273,421,407 ක අගයකින් යුතු කාර්යයන් සිදු කර නොතිබුණි. එය මුලු

කොන්ත්‍රාත් පිරිවැයෙන් 8.8% ක ප්‍රමාණයක් විය. මේ සඳහා වූ හේතු විගණනයට ඉදිරිපත් නොවීය.

(ආ) **කල්ලඩි පාලම ඉදිකිරීම**

කල්ලඩි පාලම ඉදිකිරීම් වෙනුවෙන් කොන්ත්‍රාත්කරු විසින් 2010 දෙසැම්බර් සහ 2011 ජනවාරි මාස වෙනුවෙන් ඉදිරිපත් කරන ලද අතුරු ගෙවීම් සහතික පත්‍රය මත 2011 පෙබරවාරි 23 දින රු.මිලියන 5 ක මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය සිදු කරනු ලැබේ.

පාලමේ වැඩ ආරම්භ කර 2011 ජනවාරි 31 දිනට මාස 10 ක් ගත වී තිබුණද කොන්ත්‍රාත්තුකරු විසින් සම්පූර්ණ කර තිබුණේ රු. 162,693,913ක්වූ කොන්ත්‍රාත් වටිනාකමින් 20% ක් ව අත්තිකාරම් ගෙවීමට අදාලව කොන්ත්‍රාත් කාර්යයන්ගෙන් 75% ක් පමණි. කාර්යක්ෂමතාවය දුර්වල වීම නිසා වැඩ ප්‍රමාද වීම හේතුවෙන් ගෙවනු ලැබූ අත්තිකාරම් මාස18 ක් වූ කොන්ත්‍රාත්තු කාලය තුලදීවත් ආපසු අයකර ගැනීම සිදු කළ හැකිද යන්න ගැටලු සහිත විය.

(ඇ) කල්ලඩි පාලමෙහි නිර්මාණ නැවත සැකසීම වෙනුවෙන් මාර්ග සංවර්ධන අධිකාරියේ ඉංජිනේරුවරුන් 06 දෙනෙකු වෙත එකතුව රු.575,000 ක මුදලක් ගෙවා තිබුණි. ආයතන සංග්‍රහයේ ix වන පරිච්ඡේදයේ 2 වන වගන්තිය අනුව නිලධාරීන් රජයේ සේවය සම්බන්ධයෙන් ලබාගත් විශේෂ දැනුම භාවිතා කරමින් වෙනත් ආයතනයකට හෝ පුද්ගලයකුට සපයන සේවාව මගින් ලබන ගාස්තුවෙන් ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතු මුදල අයකර ගෙන නොතිබුණි.

### 3.2.2 සුපරීක්ෂක උපදේශක

ව්‍යාපෘතිය සඳහා විදේශීය හා දේශීය උපදේශකවරුන්ගෙන් උපදේශක සේවා ලබාගැනීම සඳහා පිළිවෙලින් යෙන් 228,600,000 ක හා රු.180,200,000 ක එකඟ වූ පිරිවැයකට 2007 වර්ෂයේදී බද්ධ උපදේශක සමාගමක් පත්කර තිබුණි. මෙම කොන්ත්‍රාත්තු අගයෙන් අනියම් හා අසම්භාව්‍ය වියදම් හැර විදේශීය හා දේශීය උපදේශක තත්‍ය පිරිවැය පමණක් පිළිවෙලින් ජපන් යෙන් 216,254,710 ක් හා රු.166,542,411 ක් විය.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ .

(අ) 2007 ජූනි මස සිට මාස 06 ක සේවා කාලයක් සඳහා පත්කර තිබූ වාර්තා විශේෂඥවරයා 2010 දෙසැම්බර් අවසන් වන විට එක් මාසයක් පමණක් සේවය කර තිබුණි.ඔහු එක් මාසයක් පමණක් සේවය කිරීම හේතුවෙන් අවශ්‍යවූ සේවය ලබා ගෙන තිබුණේද යන්න විගණනයේදී

තහවුරු කර ගත නොහැකි විය. ඒ සඳහා වෙන්කර තිබූ යෙන් 16,551,470 ක වටිනාකමින් ඉතිරිය යෙන් 13,838,470 ක් වූයෙන් ඉතිරියේ ප්‍රතිශතය 84% ක් විය. ඒ හේතුවෙන් ව්‍යාපෘතිය අපේක්ෂා කළ පරිදි ව්‍යාපෘතියට අදාල වාර්තා නිසි පරිදි පිළියෙළ කර තිබුණේද යන්න හා වාර්තා විශේෂඥවරයාගේ අදාළ කාර්යයන් නිසි පරිදි ඉටු කර තිබුණේද යන්න පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්වීමට නොහැකි විය.

(ආ) දේශීය උපදේශක සේවාවේ තනතුරු 07 ක් සඳහා නිලධාරීන් බඳවා ගෙන නොතිබූ නමුත් ඒ සඳහා මිනිස් මාස 161 ක් වෙනුවෙන් රු.22,702,579 ක මුදලක් මිල ප්‍රමාණ පත්‍රය තුල පෙන්නුම් කර තිබුණි. ඒ හේතුවෙන් ඔවුන් විසින් පරීක්ෂාවට භාජනය කළ යුතු වූ කොන්ත්‍රාත්කරුගේ වැඩ කොටස් විධිමත්ව සිදු කර තිබුණේද යන්න විගණනයේදී සෑහීමකට පත්වීමට නොහැකි විය.

### 3.3 ව්‍යාපෘතියට පටහැනි කාර්යයන් වෙනුවෙන් ඒකාබද්ධ අරමුදලින් මුදල් ගෙවීම

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(අ) මාර්ගය වැඩි දියුණු කිරීමේ කටයුතු සඳහා විදේශ ණය වලින් කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු රු.11,975,941 ක වියදම් හා ව්‍යාපෘති ඇස්තමේන්තුව තුල ඇතුලත් වූ ශ්‍රම පිරිවැය ලෙස මාර්ග සංවර්ධන අධිකාරියට ගෙවූ රු.957,152 ක මුදලක් ද ව්‍යාපෘතියේ ඇස්තමේන්තුව තුල ඇතුලත් නොව කාත්තන්කුඩි නගරයේ ප්‍රධාන පාරේ ජලනල ඇතිරීම සඳහා ජලනල මිලදී ගැනීම වෙනුවෙන් වැය කළ රු.1,767,000 ක මුදලක් ද ඒකාබද්ධ අරමුදලින් දරා තිබුණි. මේ සඳහා වූ හේතු ඉදිරිපත් නොවූ අතර භාණ්ඩාගාරයේ එකඟත්වයක් ඒ සඳහා ලබාගෙන නොතිබුණි.

(ආ) ව්‍යාපෘතියට අදාල නොවන කාර්යයන් වෙනුවෙන් ප්‍රවාහන ඇමතිතුමාගේ පෞද්ගලික ලේකම්ගේ ප්‍රවාහන කුලී වෙනුවෙන රු.454,897 ක මුදලක් පුද්ගලික ප්‍රවාහන සමාගමකට ගෙවා තිබුණි.

## 4. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

### 4.1 <u>මූල්‍ය සමාලෝචනය</u>

#### 4.1.1 <u>අරමුදල් උපයෝජනය</u>

| ගිවිසුමට අනුව සැපයීමට එකඟ වූ මුදල | | 2010 වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය | 2010 වර්ෂය සඳහා අරමුදල් උපයෝජනය | 2010 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය |
|---|---|---|---|---|
| යෙන් | රු. | රු. | රු. | රු. |

| | (මිලියන) | (මිලියන) | (මිලියන) | (මිලියන) | (මිලියන) |
|---|---|---|---|---|---|
| ජා ස ජ බැ | 4,460 | 4,756 | 1,790.0 | 1,630.8 | 4,716.3 |
| ශ්‍රී ලංකා රජය | - | 1,494 | 241.9 | 241.9 | 591.3 |
| | 4,460 | 6,250 | 2,031.9 | 1,872.7* | 5,307.6* |

* අත්තිකාරම් හා උපචිත වියදම් බැහැර කිරීම හේතු කොට ගෙන මෙම මුදල් මෙම වාර්තාවේ 4.1 ඡේදයේ දැක්වෙන මුදල්වලට වෙනස් වේ.

## 4.2 මෙහෙයුම් සමාලෝචනය

### 4.2.1 කාර්යසාධනය

ණය ගිවිසුම අනුව රු.මිලියන 6,250 ක මුලු පිරිවැයකින් මාස 30 ක් ඇතුලත (දින 913 කින්) අක්කරෙයිපත්තුව හා ත්‍රික්කන්ඩුමාඩු අතර කි.මී. 100 ක මාර්ග කොටස ප්‍රතිසංස්කරණය කිරීමට සහ කල්ලඩි පාලම අලුතින් ඉදිකිරීමට චයිනා ඕවර්සීස් ඉංජිනියරින් සමූහ සමාගමට 2007 දෙසැම්බර් 06 දින බදු රහිත රු.3,806,804,232 ක වටිනාකමකට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. කොන්ත්‍රාත්තුවේ කාර්යසාධනය ඉතා දුර්වල මට්ටමක පැවතීම හේතුවෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතයායතන සමඟ ඇති වූ එකඟතාවයන් මත කල්ලඩි පාලම ඉදිකිරීම සමාගම විසින් අත්හැර තිබුණි. පසුව සමාගමේ කොන්ත්‍රාතු වටිනාකමින් රු. මිලියන 700 ක වටිනාකමක් අඩුකර රු.813,469,566 ක පිරිවැයකට 2010 අප්‍රේල් 01 සිට දින 540 කින් එම පාලම නිම කිරීම සඳහා 2010 මාර්තු 25 උන රාජ්‍ය සංවර්ධන හා ඉදිකිරීම් සංස්ථාව වෙත කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුල් කොන්ත්‍රාත්තුවේ විෂය පථය අඩු වී තිබුණද මාර්ග කොටස ප්‍රතිසංස්කරණය කිරීමේ කොන්තාතු කාලය අඩු කිරීම වෙනුවට 2010 දෙසැම්බර් 31 දින වනවිට අවස්ථා දෙකකදී තවත් දින 184 කින් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණි.

(ආ) පාලම ඉදිකිරීමට අදාල නව කොන්ත්‍රාත්තුවේ මිලෙහි රු.113,469,566 ක වැඩිවීමක් නිරීක්ෂණය වූ අතර එම මුදල ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුලදී අපේක්ෂිත විනිමය වාසිය මගින් පියවා ගැනීමට ව්‍යාපෘතිය ණයදෙන ආයතනය සමඟ එකඟවී තිබුණි. කාලපරිච්ඡේදය තුල පවත්නා අරමුදලින් කොන්ත්‍රාත්තුව නිම කිරීමට ඇති නොහැකියාව මත ශ්‍රී ලංකා රජයට අතිරේක පිරිවැය දැරීමට සිදු වේ.

(ඇ) 2010 අප්‍රේල් 01 දිනෙන් ආරම්භ කර 2011 සැප්තැම්බර් 30 දිනෙන් එනම් මාස 18 කින් නිම කළයුතු කල්ලඩි පාලම සම්බන්ධයෙන් වූ නව කොන්ත්‍රාත්තුවේ 2010 දෙසැම්බර් 31 දිනට 8.2%ක් ව තත්‍ය ප්‍රගතියට එරෙහිව අපේක්ෂිත ප්‍රගතිය 26.08% ක් වී තිබුණි.

(ඈ) 2010 දෙසැම්බර් මස ප්‍රගති වාර්තාවේ ඇතුලත් කොන්ත්‍රාත්කරුගේ වැඩ සැලසුම් අනුව සහ ප්‍රගතිය පිළිබඳ සටහන් අනුව ප්‍රධාන කාර්යයන්හි අපේක්ෂිත ප්‍රගතිය හා තත්‍ය ප්‍රගතිය අතර අඩුවීම 0.08% සිට 29.04% දක්වා පරාසයක විහිදී තිබුණි.

### 4.2.2 භෞතික කාර්යසාධනය

2010 සැප්තැම්බර් 30 දිනට මාර්ගයේ හා කල්ලඩි පාලමේ භෞතික කාර්යසාධනය පිළිවෙලින් 100%ක්වූ සහ 26.08ක්වූ සැලසුම්ගත කාර්යයන්ට එරෙහිව 99.81%ක් හා 8.2%ක විය. විස්තර පහත පරිදි විය.

| කොන්ත්‍රාත්තුව | සංශෝධනය කළ කොන්ත්‍රාත්තු වටිනාකම රු. (මිලි.) | 2010 දෙසැම්බර් 31දිනට තත්‍ය වියදම රු. (මිලි.) | 2010 දෙසැම්බර් 31දිනට අපේක්ෂිත ප්‍රගතිය (%) | 2010 දෙසැම්බර් 31දිනට තත්‍ය භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| 1. ඒ 4 මාර්ගයේ කි.මී.364 සිට කි.මී.427 ක් දක්වා කි.මී.64 ක් හා ඒ 15 මාර්ගයේ කි.මී.36 ක් ප්‍රතිසංකරණය | 3106.804 | 2906.614 | 100 | 99.8 |
| 2. කල්ලඩි පාලම ඉදි කිරීම | 813.469 | 59.387 | 26.08 | 8.2 |